# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1961/34 - 2016 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා - 2016.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ, ලියාපදිංචි අංක පී. වී. 66705 දරන, ශ්‍රී ලංකාවේ සමාගමක් වශයෙන් සංස්ථාගත කරනු ලැබූ කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රෙනින් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඈ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුම් ද සහතිව මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් එහි උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස එකී කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රෙනින් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ් යන ආයතනය පිළිගනිමි.

**I උපලේඛනය**

***කොන්දේසි***

1. කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රෙනින් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය, විද්‍යාවේදී ජෛව වෛද්‍ය විද්‍යා ගෞරව උපාධිය සඳහා වන අධ්‍යයන කාලය වර්ෂ 4 ක් විය යුතු අතර, අධ්‍යයන සම්භාර පැය ගණන 120 ක් විය යුතු ය.

2. කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රෙනින් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය, විද්‍යාවේදී මනෝ විද්‍යා ගෞරව උපාධිය සඳහා ඇතුළත්වීමේ සුදුසුකමක් ලෙස ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.

**II උපලේඛනය**

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *උපාධි පාඨමාලා* | *උපාධි සඳහා කෙටි යෙදුම්* |
| විද්‍යාවේදී ජෛව වෛද්‍ය විද්‍යා ගෞරව උපාධිය | BScHons (BiomedSc) |
| විද්‍යාවේදී මනෝ විද්‍යා ගෞරව උපාධිය | BScHons (Psychology) |
| මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිය | BMHons (Human Resource) |
| අලෙවි කළමනාකරණ ගෞරව උපාධිය | BMHons (Marketing) |
| ගිණුම්කරණ කළමනාකරණ ගෞරව උපාධිය | BMHons (Accounting) |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ දී ය.

04 - 951


1A - PG 2918 — 506 (2016/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*